# සංවර්ධනයට එක්වන තොටිල්ල පදවන අත

සංවර්ධනය යන වචනය මෑතක සිට අප කාගේත් සවන් තුළ දෝංකාරය දෙමින් පවතින්නකි. සංවර්ධනය යන්නට විවිධ අරුත් දියහැකි අතර මෙහිලා විශේෂ අවධානය යොමු කරනු ලබන්නේ ආර්ථික හා අධ්‍යාත්මික සංවර්ධනය සඳහා කාන්තාවට සහභාගි විය හැක්කේ කෙසේද යන්න කෙරෙහිය. වර්ෂයක් පාසා ජාත්‍යන්තර කාන්තා දිනයක් සමරනු ලැබීමේ එක් පරමාර්ථයක් වන්නේ කාන්තාව සංවර්ධනය සඳහා කරනු ලබන සේවය වෙනුවෙන් ඇයට උපහාර දැක්වීමකි.

ඈත අතීතයේදී පෙරදිග කාන්තාව සමාජයට පිවිසීමේ වරප්‍රසාද අහිමි වී තිබූ පුරවැසියන් පිරිසක් විය. එකල ඇගෙන් රටේ සංවර්ධනයට වූ සේවය නම් රටේ සංවර්ධනයට අවශ්‍ය පුරවැසියන් බිහිකිරීම හා පවුල නමැති සමාජය තුළ තමා සතු වගකීම් හා යුතුකම් සම්භාරයන් ඉටුකිරීමත්ය. මෙහිදී ඇය විසින් තම පවුලේ සාමාජිකයන්ට තම මාතෘත්වයේ වගකීම වන ආදරය, කරුණාව, ආරක්ෂාව හා ආශීර්වාදය තුළින් සදාචාර සම්පන්න සමාජයක් ඇතිකිරීමට උදව් වේ. ‘‘ගම හැදුනොත් රට හැදේ’’ යනු පැරණි කියමනකි. ගමක් යනු පවුල නැමැති සමාජයන් කිහිපයක එකතුවකි. එසේ නම් යහපත් ගුණගරුක පුරවැසියන් බිහිවූ පවුලක් ගමක සංවර්ධනයේ හා සෞභාග්‍යයේ කැඩපතක් වේ. මෙවැනි ගුණගරුක යහපත් ශිෂ්ට සම්පන්න පුරවැසියන් සමාජයට එක් කිරීම් මූලික වෙහෙස දරනු ලබන්නේ කාන්තාව විසිනි. නැතහොත් අම්මාවරුන් විසිනි. ඇය මේ සඳහා තම ආත්ම ශක්තිය හා ධෛර්‍ය නොඅඩුව සපයනු ලබයි.

වත්මන් කාන්තාවන්ට සමාජයට පිවිසීමේ වරප්‍රසාදයද ඇති බැවින් ඇය විසින් ඉහත කී යුතුකම් වලට අමතරව විවිධ සංවර්ධන කාර්යයන් සඳහාද තම ශ්‍රමය කැප කරනු ලැබේ. මෙහිදී ආර්ථික සංවර්ධනය උදෙසා ඇය විසින් ඉටුකරනු ලබන මෙහෙය සුළුපටු නොවේ. එහෙත් විවිධ මට්ටමේ අධ්‍යාපනික හා ප්‍රායෝගික පුහුණුව ලැබූ කාන්තාවන් අප රටේ සංවර්ධනයට සහභාගිවීය නොහැකිව පසුතැවිලි වෙමින් සිටිනු දැකීම විරල නොවේ. තම පවුලේ සහෝදර සහෝදරියන් හා දෙමව්පියන් ආර්ථික ප්‍රශ්න වලින් මුදා ගැනීම සඳහාද අද කාන්තාව පෙරමුණට එයි. මෙහිලා ඇය විසින් තමාට කළ හැකි හෝ කළ නොහැකි දේ



දරුපල රකිනුවස් පලවැල නෙලන මවක්

මොනවා දැයි තෝරා බේරා ගැනීමක් නොමැතිව තම ආත්ම ශක්තිය හා ධෛර්‍යය යොදා ආදයමක් ලබා ගතහැකි කුමනා හෝ රැකියාවක නිරත වෙයි. කාන්තාවෝ වැඩි පිරිසක් ස්වයං රැකියාවන්හි නිරත වෙමින් රටට අවශ්‍ය විවිධ නිෂ්පාදනයන් හා විදේශ විනිමය ඉපයීමට සහභාගි වෙති. මේ සඳහා ඔවුන්ගේ සිතුම් පැතුම්වල ගතික ස්වභාවය, ප්‍රදේශයේ භෞතික ආකල්පයන් හා දැනුම උපකාරී වී ඇත. මේ හැර අද අපේ රටට විදේශ විනිමයක් ලබා දෙන බොහෝ ආයතනයන්හි සේවිකා

ලිය වන කම්කරු කොටස් වැඩි සහභාගිත්වය ගනු ලබන්නේද කාන්තාවන්ය.

කෘෂිකාර්මික සංවර්ධනය ගැන සලකා බැලුවද කාන්තාව දක්වන සම්බන්ධතාවය, සහ යෝගය හා කාර්යශූරත්වය සැලකිල්ලට ගත යුතුය. අප රටට විදේශ විනිමය ලබා දෙන ප්‍රධාන කෘෂිකාර්මික ආයතන යන් වන තේ, රබර්, පොල් කර්මාන්ත දෙස බලන කල එහිදී විවිධ කාර්යයන් සඳහා කාන්තා ශ්‍රමය උපයෝගී කර ගනී. කාර්මික හා කෘෂිකාර්මික අංශයන්හිදී කිසිදු සැලකීමකින් තොරව පුරුෂ පක්ෂය සමග කාන්තාවෝ උරෙනුර ගැටී කට යුතු කරති. ඇතැම් අවස්ථාවන් හිදී පුරුෂ පක්ෂයට සමාන ඵල දයකත්වයක් ලබා දීමටද කාන් තාව සමත් වී ඇත. මේ නිසා අප රටේ සංවර්ධන කාර්යය සඳහා ඇයගේ සහභාගිත්වය තවමත් ළදරු අවස්ථාවේ පව තින බැව් පෙනේ. නිෂ්පාදන කාර්යයන්ට වඩා ඵලදයී කාර්ය සමුදයක් සේවා අංශයේදී කාන් තාවන්ගෙන් ලබාගත හැක.

විවිධ මට්ටම් වලින් යුක්ත පරිපාලන කාර්යයන්ට හා සේවා සැපයීම් කෙරෙහි කාන්තාවන් වැඩි වශයෙන් යොදා ගන්නේ නම් එහිදී සංවර්ධනයේ මුහුණු වර කීපයක් කරා අපට ළඟාවී මට පුළුවන් වෙනු ඇත. මෙම ලිපියේ සඳහන් කර ඇති පරිදි ආදි කාලීන කාන්තාවන් සතුව තිබූ වගකීම් හා යුතුකම් ප්‍රමාණය වත්මන් කාන්තාවන්ද සතුව පවතී. ඇයට ඒ සඳහා මානසික හා කායික තෘප්තියක් මෙන්ම විදේකයක්ද අවශ්‍ය වේ. නිෂ්පාදන කාර්යයන්හි නියුක්ත

**තාක්ෂණික හා විද්‍යාත්මක දැනුම සමග නවීකරණ වන සංකීර්ණ ලෝකයක් සමග අපද ඉදිරියට යා යුතුය. එසේ නොමැතිව රටේ සංවර්ධනයක් ගැන සිතීම සිහිනයක් පමණක් වනු ඇත. රටක පුරවැසියන්ට අවශ්‍ය තාක්ෂණික හා විද්‍යාත්මක දැනුම ලබා දීමේදී අධ්‍යාපනයට මූලික ස්ථානය හිමිවිය යුතුය. අද රටේ කාන්තාවන්ට උසස් අධ්‍යාපනයක් ලබා ගැනීමට නිදහස ඇත.**

කාන්තාවන්ට වඩා සේවාඅංශ යන්හි නියුක්ත කාන්තාවනට ඉහතකී අවශ්‍යතා සපුරා ගැනීම පහසුය. එබැවින් ආර්ථික සංවර් ධනය සඳහා වුවද කාන්තාව සහභාගී කර ගැනීමේදී ඇය සතු වගකීම හා කාර්ය භාරය කෙරෙහි විශේෂ සැලකිල්ල යොමු කළ යුතුය. විශේෂයෙන්ම පෙර දිග රටවල පවත්නා සිතුම්

පර්යේෂණ හා පුහුණුකිරීමේ නිලධාරිනී

## චිත්‍රා පෙරේරා

පැතුම් අනුව ගෙදර දෙරේ වැඩ කටයුතු සම්පූර්ණයෙන්ම වාගේ කාන්තාව අතින් ඉටුවිය යුතු යයි මතයක් පවතී. එහෙත් තම පවුලේ කටයුතු වලට මෙන්ම ආර්ථික සංවර්ධන කට යුතු කෙරෙහිද දිවා රෑ නොබලා ශ්‍රමය කැප කරන ඔවුන් කෙරෙහි සමාජයේ අනෙක් කොටස්වල කාරුණික අවධා නය යොමුවිය යුතුය. සමාජවාදී රටවල මෙන් ගෙදර දෙරේ වැඩ කටයුතු සාමූහිකව ඉටුකර ගැනීම මෙයට එක් සහනයක් වනු ඇත.

ආර්ථික සංවර්ධනය යනු ජාතික නිෂ්පාදිතයේ වැඩි වීමකි. කාන්තාවන්ගේ සහභාගිත්වය ඇතිව නිපදවනු ලබන භාණ්ඩ අලෙවි කර ගැනීමේදීද කාන්තාවන්ගේ සහභාගීත්වය නැතිවම බැරිය. සේවා නිෂ්පාදන අංශයේදී වාණිජ සේවාවන් ඉටුකිරීම සඳහා විවිධාකාරයෙන් කාන්තාවන් සහභාගී කර ගනී. විශේෂයෙන්ම පෞද්ගලික අංශයේ වෙළඳසැල්වල වෙළඳ සේවක කටයුතු සඳහා හා පිළිගැනීමේ නිලධාරීන් සඳහා යොදා ගනු ලබන්නේ කාන්තාවන්ය. කාන් තාව සතු සහජ දයාදයක් වන සිත්ගන්නා සුළු බව කාරුණික බව, ඉවසීම ආදිය මෙයට හේතු වේ. අද අප රටේ සංවර්ධන කට යුතු වලදී රාජ්‍ය අංශයට වඩා පෞද්ගලික අංශයේ ආයතන ඉදිරියෙන් සිටීමටද හේතු වී ඇත්තේ පෞද්ගලික අංශයේ වෙළඳ සැල් හිමියන් තම සේව කයන් ලවා පරිභෝගිකයන් ගෙන්වා ගැනීමට සමත්වීමය. රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවකයන් තුළ පවත්නා ආකල් පය මෙම වෙනසට හේතුවක් වියහැක, වැටුප් විෂමතාවන්, සේවා පහසුකම්, සෘජු පාලන ක්‍රම, සුපරීක්ෂාව, සේවයේ ස්ථිරභාවය, යන හේතුන්ද බල

පෑ හැකිය. එම නිසා රාජ්‍ය අංශයේ කටයුතු සංවර්ධනය කිරීමෙහිලා තව දුරටත් මෙවැනි අඩුපාඩු පිළිබඳව සොයා බලා අවශ්‍ය පියවර ගැනීම කාලෝචිතය.

මේ නිසා ඔවුන්ට තම හැකියාවන් හා කුසලතාවන් වර්ධනය කර ගැනීමෙන් සංවර්ධනයට සහභාගි වීමේ මාර්ග සොයා ගත හැක. පුද්ගලයෙකු අධ්‍යාපනයක් ලබනවා යනු ලිවීමට කියවීමට හා කිසියම් විෂයයක් පිළිබඳව දැනුම් සම්භාරයක් ලබා ගැනීම පමණක්ම නොවේ. මෙහිදී අධ්‍යාත්මික වශයෙන් ඔහුගේ වර්ධනයක් සිදුවිය යුතුය. කුඩාකල පටන්ම දරුවකු යහමගට යොමුකර වීමේ උදරතර කාර්යය ඉටුකරනු ලබන කාන්තාවන් අප රටේ අධ්‍යාපනික ක්ෂෙත්‍රය තුළද විශාල වශයෙන් කේන්ද්‍රගතය වී ඇත.

පෞරුෂත්ව සංවර්ධනයද අධ්‍යාත්මික සංවර්ධනයේ එක් පැත්තකි. මෙහිදී තමා යටතේ ඇතිදැඩි වන දරුවන්ගේ පෞරුෂත්වයට හානියක් නොවන පරිදි ක්‍රියා කිරීමට කාන්තාව වග බලාගනී. යම් පුද්ගලයකුගේ හොඳ ලක්ෂණ ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීමත් දුර්වලතාවයන් පෞද්ගලිකව ඔහුට දැනුම් දීමත් නිසා පෞරුෂත්වයට එතරම් හානියක් සිදු නොවේ. සංවර්ධනය උදෙසා කාන්තාවන් වැඩි වශයෙන් සහභාගි කර ගැනීමේදී ඔවුනොවුන්ට එකිනෙකා විවේචනය කර ගැනීමට ඇති කාලය හීනවීම මෙම අංශයේදී එක් වාසියක් වී ඇත.

ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් සංවර්ධනය යනු අපරදිග සංවර්ධිත රටවල තත්ත්වයට පැමිණීම හෝ ඒ කරා යාමට උත්සාහ කිරීමත් නොවේ. අප සංවර්ධනය සමග ඉදිරියට යා යුත්තේ අපේ සිංහල ජාතියේ සිරිත් විරිත්, ආකල්ප හා සාර ධර්මයන්ද සමඟය. අපට මේ සෑම එකක්ම එලෙසම පවත්වා ගැනීම හෝ ඒවා සම්පූර්ණයෙන්ම අමතක කිරීම කළ නොහැක. එහෙයින් සංවර්ධනය කරා යන ගමනේදී හෙළ සිරිත් විරිත් හා අපරදිගින් පැමිණෙන සංකර සිරිත් විරිත් පට ලවා නොගැනීමට කාන්තාව බුද්ධිමත් විය යුතුය. අප ඔවුන්ගෙන් අවශ්‍ය හා ගැළපෙන දේ පමණක් ලබා ගැනීමට සූදනම් විය යුතුය. සංවර්ධනය යන්න රුපියල් ශත වලින් ගණනය කළ හැකි දෙයක් නොවන නිසා රුපියල් ශත වලින් ගණනය කළ නොහැකි සංස්කෘතික වටිනාකම් ආරක්ෂා කරගෙන සංවර්ධනය කරා ළංවිය යුතුය.

සමාජයෙන් කොන්වූ පිරිසක් ලෙස ජීවත්වූ කාන්තාවන්ට අද සමාජය ඉදිරියට පැමිණ ඉහත කී ආකාරයේ නොයෙකුත් කාර්යයන්හි නිරත වීමෙන් තම ජාතියේ දියුණුවට අතහිත දීමට පිළිවන් වීම ඇත්ත වශයෙන්ම ප්‍රීතියට කරුණකි. එහෙත් ස්වාධීනව තීරණ ගැනීමට හා මීට වඩා තම රටට සේවය කිරීමට අවශ්‍ය පරිසරය කාන්තාවන්ට ලබා දීම යුක්ති සහගතය. රටක පැවැත්ම උදෙසා කාන්තාවන් විසින් තම ගෘහයේදී හා කාර්ය ස්ථානයන්හිදී ඉටුකරනු ලබන කාර්ය සම්භාරය දෙස බලන කල ඇයට මානසික හෝ කායික විවේකයක් තිබේද යන්න සැක සහිතය. මෙවැනි තත්ත්වයක් යටතේ ඇය අතින් සිදුවිය හැකි සුළු අඩුපාඩුකම් වලට සමාජයේ අනුකම්පාව ඇය වෙත යොමු විය යුතුය.

දහසකුත් එකක් දුෂ්කරතාව යන් මධ්‍යයේ විවිධ සංවර්ධන කාර්යයන්ට සහභාගිවන කාන්තාවන් ඔවුන් විසින් ලබාදුන් සංවර්ධනය මගින්ම ගරහනු ලැබීම නම් කණගාටුදායකය. මමෙසේ කියන්නේ විවිධ නිෂ්පාදන කටයුතු සඳහා සම්බන්ධ වන කාන්තාවන්ගේ ගෞරවය තම දෑතින් නිපදවූ භාණ්ඩ අලෙවිකර ගැනීමට දරන උත්සාහයේදී නැතිවී යාම නිසාය. සංකීර්ණවූ වත්මන් වාණිජ ලෝකයේ භාණ්ඩ නිෂ්පාදකයන් විසින් තම භාණ්ඩ විකුණා ගැනීමට දරණ තරහයේදී කාන්තාව වෙළඳ භාණ්ඩයක් බවට පත්කර ගෙන තිබීම ගෝචනීයයි. මෙහිදී ඇය විසින් ගොඩනගනු ලැබූ ගුණගරුක, ශිෂ්ට සම්පන්න සමාජය ඇය දෙස බලන්නේ වාණිජ මට්ටමකිනි. එසේ නැතහොත් පහත් හැඟීමකිනි. විවිධ තරහකාරී භාණ්ඩ වෙළඳසැලේ අලෙවි කර ගැනිම සඳහා ප්‍රචාරයක් අවශ්‍ය වුවද ඒ සඳහා කාන්තාව ප්‍රචාරක මාධ්‍යයක් ලෙස යොදා ගැනීම ඇයට කරන අගෞරවයකි.

ජාතික ස්වයංපෝෂිත ක්‍රියාවලියේ ප්‍රබල නියමුවෙක් ලෙස සංවර්ධනයට සහභාගිවන කාන්තාව සමාජයේ මුහුණපෑමට සිදුවන ගැරහීම් වලට නොබියව ඉදිරියට ගමන් කරන්නේ රට සංවර්ධනය කිරීමේ මූලික පරමාර්ථය සිතැතිවය.